# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,216 - 2021 පෙබරවාරි මස 19 වැනි සිකුරාදා - 2021.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 338 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 357 |

*සැ. යු.*-(i) සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 පෙබරවාරි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සිසිර ජයකොඩි සියපත පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 පෙබරවාරි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත 2021 පෙබරවාරි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 මාර්තු මස 12 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 පෙබරවාරි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට්* පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

335 B 82205 — 5,403 (2021/02)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල

පුරප්පාඩු

1. විශේෂඥ වෛද්‍ය නිලධාරි -I ශ්‍රේණිය
   - විශේෂඥ වෛද්‍ය නිලධාරි කායික රෝග
   - විශේෂඥ වෛද්‍ය නිලධාරි හදිසි ප්‍රතිකාර
   - විශේෂඥ වෛද්‍ය නිලධාරි නිර්වින්දන
   - විශේෂඥ වෛද්‍ය නිලධාරි දැඩි සත්කාර
   - විශේෂඥ වෛද්‍ය නිලධාරි ළමා හෘද රෝග
   - විශේෂඥ ශල්‍ය වෛද්‍ය නිලධාරි ප්ලාස්ටික් සැත්කම්
   - විශේෂඥ ශල්‍ය වෛද්‍ය නිලධාරි (වකුගඩු,අක්මා හා පිත්තප්‍රණාල බද්ධ කිරීම පිළිබඳ හැකියාව ඇති)
   - විශේෂඥ වෛද්‍ය නිලධාරි අක්ෂි
   - විශේෂඥ ශල්‍ය වෛද්‍ය නිලධාරි මුඛ, හනු, මුහුණු
   - විශේෂඥ වෛද්‍ය නිලධාරි දන්ත සංරක්ෂණ

*සුදුසුකම්* **:**

I. 2018 අංක 28 දරන වෛද්‍ය (සංශෝධන)පනතට අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි/ලියාපදිංචි විය හැකි වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු විය යුතුය;

හෝ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය සහිත වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු වීම;

සහ

III. විශේෂඥ වෛද්‍ය(MD / MS) උපාධිය සමග කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාණ්ඩල සහතිකය (Board Certification) ලබා තිබීම. (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014දින නිකුත් කරන ලද1883/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* I වන ඇමුණුම);

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

*වයස් සීමාව* **:**

අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* **:**

MC 1-2 රු.(91,645 - 12 × 2,700 - රු. 124,045)
*විශේෂඥ වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය MC 1-2 පියවර 01 හි තබනු ලැබේ.

2. වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය

*සුදුසුකම්* **:**

i වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

සහ

ii. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මකවන ආයතනවල II ශ්‍රේණිය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද ලබා තිබීම;

සහ

iii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම;

සහ

iv. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

*වයස් සීමාව* **:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* **:**

MO 1-1 රු.(58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015)
*වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ.- රු.78,585.00

3. දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි - **I** ශ්‍රේණිය

*සුදුසුකම්* **:**

i. දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

සහ

ii. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස

යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල II වන ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර නවයක (09)ක පළපුරුද්ද ලබා තිබීම;

සහ

iii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම;

සහ

iv. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

*වයස් සීමාව* **:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* **:**

MO 1-1 රු. (58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015)

* දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ.- රු.78,585.00

4. <u>වෛද්‍ය නිලධාරී -II ශ්‍රේණිය</u>

සුදුසුකම්:

i. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

සහ

ii. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල්,සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන රෝහලක අවම වශයෙන් වසර දෙකක (02)පළපුරුද්ද ලබා තිබීම;

සහ

iii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing"ලබා තිබීම.

*වයස් සීමාව* **:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* **:**

MO 1-1 රු.(58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015)
*වෛද්‍ය නිලධාරී II ශ්‍රේණිය MO 1-1 පියවර 05 හි තබනු ලැබේ. - රු.64,185.00

5. දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී -**II** ශ්‍රේණිය

සුදුසුකම්:

i. දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

ii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

*වයස් සීමාව* **:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* **:**

MO 1-1 රු. (58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015)
*දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී II ශ්‍රේණිය MO 1-1 පියවර 01 හි තබනු ලැබේ.

6. වෛද්‍ය නිලධාරී - <u>ප්‍රාථමික ශ්‍රේණිය</u>

සුදුසුකම්:

i. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.;

සහ

ii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

*වයස් සීමාව* **:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* **:**

MO 1-1 රු.(58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015)
*වෛද්‍ය නිලධාරී ප්‍රාථමික ශ්‍රේණිය MO 1-1 පියවර 02 හි තබනු ලැබේ. - රු. 60,050.00.

7. වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්- විශේෂ ශ්‍රේණිය

- විකිරණ ශිල්පී (රෝග විනිශ්චය)
- විකිරණ ශිල්පී චිකිත්සක
- වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී
- භෞතචිකිත්සක
- ඖෂධවේදී
- අක්ෂි තාක්ෂණවේදී

සුදුසුකම් :

i. සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

සහ

ii. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ සේවය කර ඇත්නම් අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සියල්ල සමත් වී තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

*වයස් සීමාව* :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය:

MT 8 -රු. (50,970 - 10 x 1,385 - 8 x 1,910 - රු.80,100 )
*වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන් විශේෂ ශ්‍රේණිය MT 8 පියවර 3හි තබනු ලැබේ.- රු. 53,740.00

8. හෙද පාලිකා - (විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී) ඃ

*සුදුසුකම්* :

i. විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම;

සහ

ii. ජාතික හෙද අධ්‍යාපන ආයතනය/පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල විසින් පවත්වනු ලබන වාට්ටු කළමණාකරන හා අධීක්‍ෂණය / ඉගැන්වීම සහ අධීක්‍ෂණය / මහජන සෞඛ්‍ය හෙදකම් හා වින්නඹු කර්මය / මානසික හෙදකම අඩංගු අවුරුදු 1 ½ ඩිප්ලෝමා පාඨමාලාව හදාරා, I වන ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) තනතුරක වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

සහ

iii. තෙවැනි කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම;

සහ

iv. පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.;

සහ

v. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමකට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම්කර තිබීම.

*වයස් සීමාව* :

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* :

MT 8 - රු. (50,970 - 10 x 1,385 - 8 x 1,910 - රු. 80,100 )

*හෙද පාලිකා - විශේෂ ශ්‍රේණිය MT 8 පියවර 4 හි තබනු ලැබේ.- රු. 55,125.00

9. හෙද සොහොයුරිය ඃ

සුදුසුකම් :

i. I වන ශ්‍රේණියේ නිලධරයෙකු වීම.

සහ

ii. ජාතික හෙද අධ්‍යාපන ආයතනය / පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල විසින් පවත්වනු ලබන වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය / ඉගැන්වීම හා අධීක්ෂණය / මහජන සෞඛ්‍ය හෙදකම හා වින්නඹු කර්මය / මානසික හෙදකම අඩංගු අවුරුදු 1 1/2 ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඉන් සමත් වු නිලධරයෙකු වීම.;

සහ

iii. දෙවැනි කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය සමත්වී තිබීම.;

සහ

iv. පූර්වාසන්නතම වසර (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

සහ

v. අනුමත කාර්ය සාධන පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

*වයස් සීමාව* **:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* **:**

MT 7 - රු.(33,295 - 10 x 445- 11 x 660 - 10 x 730 - 5 x 750 - රු. 59,805)

*හෙද සොහොයුරිය MT 7 පියවර 23 හි තබනු ලැබේ. රු.45,735.00

10. හෙද නිලධාරි ඃ

*සුදුසුකම්* **:**

i. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය මගින් හෝ හෙද සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක හෙද ඩිප්ලෝමා පාඨමාලාව හෝ උපාධිය සම්පූර්ණ කර තිබීම.;

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේදී විද්‍යා විෂය ධාරාවට අයත්, ජීව විද්‍යාව/ ගණිතය/කෘෂි විද්‍යාව විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම, පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්වීම;

සහ

iii. සිංහල / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*වයස් සීමාව* **:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* **:**

MT 7 - රු.(33,295 - 10 x 445- 11 x 660 - 10 x 730 - 5 x 750 - රු. 59,805)

*හෙද නිලධාරි MT 7 පියවර 01 හි තබනු ලැබේ.

11. ඖෂධවේදී ඃ

සුදුසුකම් **:**

i. සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.;

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් (02) එකවර සමත් වීම;

සහ

iii. (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ ඖෂධවේදී/ විද්‍යාවේදී (ඖෂධවේදී) උපාධියක් ලබා තිබීම.;

හෝ

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දෑ අවුරුදු පූර්ණ කාලීන ඖෂධවේදී ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.;

සහ

iv. (අ) ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.;

හෝ

(ආ) විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.;

*වයස් සීමාව* **:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය**:**

MT 6 - රු.(32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)
*ඖෂධවේදී MT 6 පියවර 01 හි තබනු ලැබේ.

12. විකිරණ ශිල්පී (චිකිත්සක)

සුදුසුකම්:

i. සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුලු විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින්(06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.;

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම;

සහ

iii. (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ විකිරණ ප්‍රතිකාරකවේදී/විකිරණ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම;

හෝ

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන විකිරණ ශිල්පී දෑ අවුරු ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම;

සහ

iv. (අ) විකිරණ ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.;

හෝ

(ආ) විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් විකිරණ ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

*වයස් සීමාව* :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* :

MT 6 -රු.(32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

*විකිරණ ශිල්පී (චිකිත්සක) MT 6 පියවර 01 හි තබනු ලැබේ.

13. වෘත්තීය චිකිත්සක :

*සුදුසුකම්* :

i. සිංහල/ දෙමළ,ගණිතය,විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට (4) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (6) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත්වීම;

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් (2) එකවර සමත් වීම;

සහ

iii. (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ වෘත්තීය චිකිත්සකවේදී උපාධියක් ලබා තිබීම;

හෝ

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන වෘත්තීය චිකිත්සක දෑ අවුරුදු ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම;

සහ

iv. (අ) වෘත්තිය චිකිත්සකයෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.;

හෝ

(ආ) විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් වෘත්තිය චිකිත්සකයෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

*වයස් සීමාව*:

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය*:

MT 6 -රු. (32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

*වෘත්තීය චිකිත්සක MT 6 පියවර 01 හි තබනු ලැබේ.

14. දන්ත කාර්මික ශිල්පී

*සුදුසුකම්* :

i. සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුලුව විෂයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම;

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයන් දෙකක් (02) එකවර සමත්වීම;

සහ

iii. පේරාදෙණිය දන්ත වෛද්‍ය පීඨය/සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දන්ත කාර්මික ශිල්පී දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම;

සහ

iv. ශ්‍රී ලංකාවේ වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

*වයස් සීමාව* :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* :

MT 6 - රු. (32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - 59,360)

*දන්ත කාර්මික ශිල්පී MT 6 පියවර 01 හි තබනු ලැබේ.

15. අක්ෂි තාක්ෂණවේදී :

*සුදුසුකම්* :

i. සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම;

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් දෙකක් (02) එකවර සමත්වීම;

සහ

iii. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන අක්ෂි තාක්ෂණවේදී දෑ අවුරුදු පූර්ණ කාලින ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම;

සහ

iv. අක්ෂි තාක්ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම;

හෝ

විදේශ උපාධියක් ලබා ඇති අයෙක්නම් අක්ෂි තාක්‍ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

*වයස් සීමාව*:

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* :

MT 6 - රු.(32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - 59,360)

*අක්ෂි තාක්‍ෂණවේදී MT 6 පියවර 01 හි තබනු ලැබේ.

16. ඍජුනේත්‍ර

*සුදුසුකම්* :

i. අක්ෂි තාක්‍ෂණවේදී තනතුරෙහි ස්ථිර කරන ලද නිලධාරියෙකු වීම;

සහ

ii. අදාළ තනතුරේ II වන ශ්‍රේණියට අයත් කාර්යක්‍ෂමතා කඩඉම සමත් II වන ශ්‍රේණියේ හෝ ඊට ඉහළ නිලධාරියෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවන අවසාන දිනට අඛණ්ඩ වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.;

සහ

iii. ශ්‍රී ලංකා අක්ෂි රෝහල මගින් පවත්වනු ලබන මාස 06 ක ඍජු නේත්‍රඥ පුහුණුව සම්පූර්ණ කර අවසන් විභාගය සමත් වී තිබීම.

සහ

iv. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

*වයස් සීමාව*:

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* :

MT 6 -රු.(32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

*සෘජු නේත්‍රඥ MT 6 පියවර 01 හි තබනු ලැබේ.

17. වාග් චිකිත්සක :

සුදුසුකම්:

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ වාග් චිකිත්සාව පිළිබඳ වසර 02 කට නොඅඩු පූර්ණකාලීන ඩිප්ලෝමාවක් ලබා තිබීම.

*වයස් සීමාව*:

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය*:

MT 6 -රු.(32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

*වාග් චිකිත්සක MT 6 පියවර 01 හි තබනු ලැබේ.

18. මහජන සෞඛ්‍ය පරීක්ෂක :

සුදුසුකම් :

i. සිංහල/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථය සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුළුව විෂයයන් හයකින් (06)දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම;

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, ජීව විද්‍යාව හෝ සංයුක්ත ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් (02) එකවර සමත් වීම.

සහ

iii. මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරෙහි කාර්යභාරයට අදාළව සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන වසර එකහමාරක (1 1/2) පූර්ණ කාලීන වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව හදාරා ඩිප්ලෝමා සහතිකය ලබා තිබිය යුතුය.

සහ

iv. පුරුෂ පක්ෂයට පමණක් අයදුම් කළ හැක.

*වයස් සීමාව*:

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* :

MT 5 - රු. (32,405 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - 58,915)

*මහජන සෞඛ්‍ය පරීක්ෂක MT 5 පියවර 01 හි තබනු ලැබේ.

19. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී :

*සුදුසුකම්*:

i. සිංහල/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.;

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් තුනක් එක්වරකදී සමත් වීම.

සහ

iii. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරෙහි කාර්යභාරයට අදාළව සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන වසර එකහමාරක(1 1/2) පූර්ණ කාලීන වෘත්තීමය ඩිප්ලෝමා (අභ්‍යන්තර) පාඨමාලාව සාර්ථකව හදාරා ඩිප්ලෝමා සහතිකය ලබා තිබිය යුතුය.;

සහ

iv. කාන්තා පක්ෂයට පමණක් අයදුම්කළ හැක.

*වයස් සීමාව:*

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* :

MT 5 - රු. (32,405 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - 58,915)

*පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී MT 5 පියවර 01 හි තබනු ලැබේ.

20. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)

*සුදුසුකම්* :

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/ දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත් වී තිබීම;

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම.

අමතර විශේෂ සුදුසුකම් :

ඉංග්‍රීසි, දෙමළ භාෂා ලිවීමට හා කතා කිරීමට ඇති හැකියාව සම්මුඛ පරීක්‍ෂණයේ දී විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

*වයස් සීමාව* :

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* :

MA 1-2 රු.(27,910 - 10 x 300 - 7 x 350 - 12 x 600 - 12 x 710 - රු. 49,080)

*කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) MA 1-2 පියවර 01 හි තබනු ලැබේ.

21. රියැදුරු

සුදුසුකම් :

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

*ප්‍රවීණතා* :

ii. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ පැරණි රියදුරු බලපත්‍රයට අනුව මෝටර්රථ පැදවීමේ "A" ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රයට අනුව මෝටර් රථ පැදවීමේ "D" ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

පළපුරුද්ද :

i. රියැදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම.

*කායික සුදුසුකම්* :

i. තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් දිවා රාත්‍රී කාලයේ රාජකාරි සඳහා සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර අවශ්‍යතාවය මත පැය 24 ම සේවා මුරවලට රාජකාරි සඳහා සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

ii. අවම උස අඩි 05 යි අඟල් 2 1/2 ක් විය යුතුය.

iii. ඇස් පෙනීම සම්බන්ධයෙන් පහත සඳහන් උපමාන වල දක්වා ඇති යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(අ) බර වාහන රියැදුරන් බඳවා ගැනීමේදී ඇස් පෙනීම සම්බන්ධව ලංකා අක්ෂි වෛද්‍ය සංගමය පිළිගත් නිර්ණායක වන වම් ඇස සහ දකුණු ඇස 6/9 සීමාව තුළ පැවතිය යුතුය.

(ආ) වර්ණ අන්ධතාවය පරීක්ෂා කිරීමේදී ලංකා අක්ෂි වෛද්‍ය සංගමයේ නිර්දේශිත නිර්ණායකයන් අනුව වර්ණ අන්ධතාවය නොතිබිය යුතුය.

*වයස් සීමාව* :

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය:

PL 3 රු.(26,290 - 270 x 10 - 300 x 10 - 330 x 10 - 350 x 12- රු. 39,490)

* රියැදුරු PL 3 පියවර 01 හි තබනු ලැබේ.

22. උපස්ථායක

*අධ්‍යාපන සුදුසුකම්* :

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන තුනක් (03) සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

*වයස් සීමාව* :

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* :

PL 2 රු.(25,750 - 10 x 270-10 x 300 - 10 x 330-12 x 350 - රු. 38,950)
*උපස්ථායක PL 2 පියවර 01 හි තබනු ලැබේ.

**පොදු කොන්දේසි** :

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

2. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්වවිද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන දිවයිනේ ඕනෑම ස්ථානයක හෝ සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

4. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.

5. මෙම තනතුරු ස්ථිර වන අතර, වෛද්‍ය නිලධාරි ප්‍රාථමික ශ්‍රේණිය හා අනෙකුත් විශේෂ ශ්‍රේණියේ නොවන තනතුරු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර විශේෂඥ වෛද්‍ය නිලධාරි, වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය, වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය හා අනෙකුත් විශේෂ ශ්‍රේණියේ තනතුරුවල රාජ්‍ය සේවයෙහි රැකියාවක නියුතුව සිටි නිලධාරීන් වසර එකක (1) පරිවාස කාලයකට යටත් වේ.

6. විශේෂඥ වෛද්‍යවරුන් වෛද්‍ය සහ සම සෞඛ්‍ය විද්‍යාපීඨ සිසුන්ගේ ඉගැන්වීම් කටයුතුවලටද දායක විය යුතු අතර, මෙම කාර්යය වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා පීඨවල පීඨාධිපතිවරුන්ගේ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මග පෙන්වීම යටතේ සිදුකළ යුතුය.

7. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද දරන අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරනු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සංශෝධනවලට යටත්ව).

8. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයක් සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතිකවල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් 2021.03.08 දිනට හෝ ඊට පෙර "විධායක අධ්‍යක්ෂ විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය,වේරහැර" යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

9. අයදුම්කරුවන් කෙටි ලයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

10. අසම්පූර්ණ, ප්‍රමාද වී ලැබුණු සහ අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. අයදුම්පත් භාගත කර ගැනීමට/ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට (www.kdu.ac.lk) පිවිසෙන්න.

ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්වී ආර්එස්පී යූඑස්පී
එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

02-723

**සමාජ සේවා දෙපාර්තමේන්තුව**

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

වෘත්තීය උපදේශක (III ශ්‍රේණිය)

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ආරම්භ කිරීමට නියමිත ආබාධිත පුද්ගලයින් සඳහා වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා වෘත්තීය උපදේශක තනතුරු 02ක් බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන අයදුම් පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, 02 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට **2021.03.05** දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ "වෘත්තීය උපදේශක (III ශ්‍රේණිය) සඳහා බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කර තිබිය යුතුය. www.socialservices.gov.lk වෙබ් අඩවිය හරහා ද ආදර්ශ අයදුම්පත හා විස්තර ලබා ගත හැක.

*මෙම තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් :*

1. වෘත්තීය උපදේශක ( ඉලෙක්ට්‍රොනික්,මැහුම්,)

1.1 වයස් සීමාව :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු : 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුයි.

1.2 අධ්‍යාපන සුදුසුකම් :

(අ) වෘත්තීය උපදේශක (ඉලේක්ට්‍රොනික්,මැහුම්) තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම්

(i) සිංහල/දෙමළ/භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එක් වරකදී විෂයයන් හයකින්(06) අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්ව තිබීම; සහ

(ii) අධ්‍යන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂය ධාරාවකින් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව, තෘතියික අධ්‍යාපන පාඨමාලාවක් හදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

1.3. *වෘත්තීය සුදුසුකම් :*

අදාළ වෘත්තීය පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයෙන් හෝ ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය;

හෝ

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ හෝ පේෂකර්ම දෙපාර්තමේන්තුවේ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය;

හෝ

සමාජ සේවා දෙපාර්තමේන්තුව හෝ ජාතික තරුණ සේවා සභාව හෝ ඊට අනුබද්ධ ආයතන මගින් පවත්වනු ලබන දෑ අවුරුදු හෝ ඊට වැඩි පාඨමාලා සහතික පත්‍රය;

හෝ

වෘත්තීය පුහුණු අධිකාරිය හෝ ඊට අනුබද්ධ ආයතනයකින් ලබා ගත් අදාළ වෘත්තීය පිළිබඳ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය ලබා ගැනීම;

හෝ

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා ( NVQ ) පහ (05) මට්ටමට ඇතුළත් වන්නා වූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් හෝ ඒ හා සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

1.4. *පළපුරුද්ද :*

අදාළ නොවේ.

1.5. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

1.6. *වෙනත් :*

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්තවීම
iii. තනතුරට බඳවාගැනීම සඳහා වන 1.1 සිට 1.6 දක්වා වන සියලුම සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

1.7. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පැවැත්වේ. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වූවන් අතුරින් ඉහලම ලකුණු ලැබූ කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන් පමණක්

වෘත්තීය පරීක්ෂණයට යොමු කරනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයෙන් ද සමත් වූවන් ඔවුන් ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවලත් වෘත්තීය පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවලත් මුළු එකතුව අනුව කුසලතා අනුපිළිවෙලින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් පුහුණු පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ. එම පිරිස මාස 03ක් ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා සාර්ථකව නිම කර සහතිකයක් ලබා ගත යුතුය. එසේ සහතික ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් තනතුරට බඳවා ගනු ලැබේ.

1.7.1. ලිඛිත පරීක්ෂණය :

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01 | 100 | 40 |
| අවබෝධය | කාලය පැය 01 | 100 | 40 |

1.8. වැටුප් පරිමාණය :
රා.ප.ච. 03/2016 අනුව MT- 01 -2016
වැටුප් පරිමාණය රු. 29,840-10x300-11x350-10x560-10x660-රු. 48,890/= වේ.

1.9. *සේවා කොන්දේසි :*
මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව වසර පහක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

*සටහන*

- සමාජ සේවා අධ්‍යක්ෂක විසින් තීරණය කරනු ලබන ආයතනයක් මඟින් ලිඛිත පරීක්ෂණය කොළඹ දී පැවැත්වේ.
- ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර, තෝරා ගත් අයදුම්කරුවන් අදාළ පුරප්පාඩු සහිත ආයතනයේ වසර පහක අනිවාර්ය සේවයෙන් පසුව පමණක් වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

චන්දන රණවීර ආරච්චි,
සමාජ සේවා අධ්‍යක්ෂ.

2021 පෙබරවාරි මස 12 වැනි දින,
සමාජ සේවා දෙපාර්තමේන්තුව,
2 වන මහළ,
II වන අදියර,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

.......................................... තනතුර සඳහා බඳවාගැනීමේ අයදුම් පත්‍රය

භාෂා මාධ්‍ය : ____________

01. මුලකුරු සමග නම :————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
————.

03. ලිපිනය :————.

04. දුරකථන අංකය :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————.

06. උපන් දිනය :————.

07. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :- අවුරුදු :————. මාස :————. දින :————.

08. විවාහක/ අවිවාහක බව :————.

09. ස්ත්‍රී / පුරුෂ භාවය :————.

10. අධ්‍යාපන සුදුසුකම් :-

I. *අ.පො.ස. (සාමාන්‍ය පෙළ)*

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයයන් | ශ්‍රේණිය | විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|
| ගණිතය | | | |
| සිංහල/දෙමළ/ඉංග්‍රීසි | | | |
| | | | |
| | | | |
| | | | |

II. *අ.පො.ස (උසස් පෙළ)* :

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයයන් | ශ්‍රේණිය | විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :

| පාඨමාලාවේ නම | ආයතනය | පාඨමාලා කාලය |
|---|---|---|
| | | |
| | | |

12. පළපුරුද්ද :

.......................................................................................................................
.......................................................................................................................
.............................................................................................

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

02-667

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරුවලට නිලධාරීන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2020

### Calling Applications for the Recruitment of Officers to the Post of Assistant Director (Legal) of the Commission to Investigate Allegations of Bribery or Corruption - 2020

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරුවල පවතින පුරප්පාඩු 14ක් සඳහා සුදුස්සන් තෝරාගැනීම පිණිස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2021.03.25 දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අංක 36, මලලසේකර මාවත, කොළඹ 07 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''**සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර සඳහා අයදුම්පත**'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(*අ*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.03.25 වේ.

**සටහන.**-අයදුම්පත හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බව හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මත කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාව 14 කි. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(I) මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දයක මුදල් ගෙවිය යුතුය.

(II) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(III) මෙම පත්වීම භාරගත් දින සිට වර්ෂ තුනක් (03) ඉකුත් වීමට පෙර, රජයේ ප්‍රතිපත්ති වලට අනුරූපව රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත් බව ඔබ විසින් සනාථ කළ යුතුවේ. ඔබ මෙම පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූයේ සිංහල භාෂාවෙන් නම් ඔබගේ අනෙක් රාජ්‍ය භාෂාව වනුයේ දෙමළ භාෂාව වේ. එසේම ඔබ මෙම පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූයේ දෙමළ භාෂාවෙන් නම් ඔබගේ අනෙක් රාජ්‍ය භාෂාව වනුයේ සිංහල භාෂාව වේ. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන හා ඊට අනුශාංගික වන චක්‍රලේඛවල විධිවිධාන මෙයට අදළ වේ.

(IV) තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත්කරන ලද ප්‍රදේශයේ රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

(V) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, කොමිෂන් සභාවේ අනෙකුත් නියෝගවලට ද, රජය විසින් වරින්වර නිකුත් කරන චක්‍රලේඛ රෙගුලාසිවලට ද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-5-2016, රු. 58,295-5x1,335-5x1,630-15x2,170-රු.105,670 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

04. *අධ්‍යාපන සුදුසුකම්* :

I. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

පළපුරුද්ද -

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම;

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර 03කට

නොඅඩු පහත දක්වෙන කාර්යයන්වලට අදාළ පළපුරුද්ද ලබා තිබීම :

I. නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම,
II. ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු,
III. අදාළ අණපනත් සම්බන්ධව නෛතික කටයුතු,
IV. පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු,
V. විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු

05. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 1999.03.25 දින හෝ ඊට පෙර හා 1976.03.25 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

06. *කායික සුදුසුකම්* :

සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි මැනවින් ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

07. *වෙනත් සුදුසුකම්* :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය,
II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. අයදුම්කරු හෝ පවුලේ අයකු ශ්‍රී ලංකාවේ නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරු වී නොතිබිය යුතුය.
IV. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
V. මෙම තනතුරට සුදුසුකම් ලබන්නන්ට පත්වීම් ලබාදීමට පෙර කොමිෂන් සභාවේ සේවය සඳහා යෝග්‍ය දැයි සොයා බැලීමට ආරක්ෂක නිෂ්කාශන වාර්තා කැඳවනු ලැබේ.

08. *බඳවා ගැනීමේ ක්‍රමය* :

8.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :
රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ.

8.2 යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වන සවිස්තරාත්මක ලකුණු ලබාදීමේ ක්‍රමය පහත දක්වා ඇත. :-

| අනු අංකය | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | ***අතිරේක අධ්‍යාපන සුදුසුකම්*** : | | **25** | අදාළ නොවේ |
| | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | | |
| | ● පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 25 | | |
| | ● දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 20 | | |
| | ● දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 16 | | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 22 | | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 18 | | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ. උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම් වලින් එකක් සඳහා පමණි.) | | | |
| | (උපරිම ලකුණු 25 කි.) | | | |

| අනු අංකය | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 02 | *අතිරේක වෘත්තීය පළපුරුද්ද :*<br><br>**නීතිඥවරයෙකු ලෙස නීති ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්ද**<br>නීතිඥවරයෙකු ලෙස පළපුරුද්ද - නීතිඥයෙකු ලෙස දිවුරුම් දුන් දින සිට එක් වසරකට ලකුණු 07 බැගින් උපරිම ලකුණු 35<br>(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ අධිකරණ නිලධාරීවරයෙකුගෙන් ලබා ගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.)<br><br>**අධිකරණයේ නඩු මෙහෙයවීම පිළිබඳ පළපුරුද්ද**<br>එක් වසරකට ලකුණු 07 බැගින්<br>(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකු හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ අධිකරණ නිලධාරීවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් පළපුරුද්ද සනාථ කළ යුතුය.)<br>**නීති නිලධාරියෙකු ලෙස නීතිපති දෙපාර්තමේන්තුවේ නොවන රාජ්‍ය ආයතනයක පළපුරුද්ද**<br>එක් වසරකට ලකුණු 07 බැගින්<br>(දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ප්‍රධාන නීති නිලධාරීවරයා විසින් පළපුරුද්ද සනාථ කළ යුතුය.)<br>**නීතිපති වෙනුවෙන් නඩු පැවරීම හා පෙනී සිටීම වෙනුවෙන් ලබා ඇති පළපුරුද්ද**<br>එක් වසරකට ලකුණු 07 බැගින්<br>(නීතිපති හෝ නීතිපති දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ නිලධාරීවරයෙකු විසින් පළපුරුද්ද සනාථ කළ යුතුය.)<br>(උපරිම ලකුණු 35 කි.) | | 35 | අදාළ නොවේ |
| 03 | *භාෂා ප්‍රවීණතාව :* | | 15 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරන ලද උපාධියක් සඳහා | 15 | | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 10 | | |
| | අ.පො.ස (උසස් පෙළ) (දේශීය හෝ ලන්ඩන් විෂය නිර්දේශවලට අනුව) විභාගයේ ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම සඳහා හෝ IELTS (Acadamic) score 6.5 or above හෝ TOEFL - IBT score 79 or above හෝ TOEFL-CBT score 213 or above හෝ TOEFL-PBT score 550 or above ලබා තිබීම සඳහා | 08 | | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ ආයතනයක හෝ පිළිගත් වෘත්තීය ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | 03 | | |

| අනු අංකය | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 04 | ***තොරතුරු තාක්‍ෂණය පිළිබඳ දැනුම*** :<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා දෙනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතියට අදළ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක් සඳහා<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක, තොරතුරු තාක්ෂණය, තොරතුරු පද්ධති, පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදරන ලද උපාධියක් සඳහා<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා දෙනු ලබන තොරතුරු තාක්ෂණය, තොරතුරු පද්ධති හෝ පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ඊට අදළ ඉහළ සුදුසුකමක් සඳහා<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් ලබා දෙනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාදෙනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතියට අදාළ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා<br>(එක් සහතික පත්‍රයක් සඳහා ලකුණු 03 බැගින් උපරිම සහතික පත්‍ර 02ක් සඳහා පමණක් ලබාදෙනු ලැබේ.) | | 10<br><br>09<br><br>07<br><br>06<br><br>06 | 10 |
| 05 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය<br>සාමාන්‍ය දැනීම හා බුද්ධිය - 05<br>අල්ලස් හා දූෂණ සම්බන්ධ නීතියට අදළ නූතන ප්‍රවණතා හා මාතෘකා පිළිබඳ දැනුවත්කම 05<br>තර්කන කුසලතාව, පැහැදිලිව හා ව්‍යක්තව කරුණු හා තර්ක ඉදිරිපත් කිරීමේ හැකියාව - 05 | | | 15 |
| | එකතුව | | | 100 |

09. මේ සමඟ සපයා ඇති ආදර්ශය අනුව ඉල්ලුම්පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ (A4 ප්‍රමාණයේ) කඩදාසිවල සකස් කළ යුතු අතර, 01-09 තෙක් ශීර්ෂ පළමු වන පිටුවෙහි අඩංගු වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. පරිගණකයේ සකස් කරන ලද/යතුරු ලියන කරන ලද අයදුම්පත් ද භාවිතා කල හැකිය. මේ සමඟ ආදර්ශ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත්‍ර, අසම්පූර්ණ අයදුම්පත්‍ර, දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය *ගැසට්* නිවේදනයට යා කර ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි.

9.1 අපේක්ෂකයාගේ අනන්‍යතාව :

අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත ලේඛනවලින් එකක් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

තවද අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී හෝ විමසන ඕනෑම අවස්ථාවක පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටියි.

(i) අධ්‍යාපන සහතික
(ii) උප්පැන්න සහතිකය
(iii) ජාතික හැඳුනුම්පත
(iv) පළපුරුද්ද පිළිබඳ සහතික (අධිකරණ නිලධාරියකු හෝ අවම වශයෙන් වසර 10කට නොඅඩු වෘත්තීය පළපුරුද්ද ඇති නීතිඥවරයකු විසින් නිකුත් කරන ලද සහතික වලින් සනාථ විය යුතුය.)
(v) චරිත සහතික දෙකක් (මින් එකක් ග්‍රාම නිලධාරී සහතිකයක් විය යුතුය.)

*සැලකිය යුතුයි :*

(*අ*) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපත් නොඇමිණිය යුතුය.

(*ආ*) ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවකදී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

10. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රු.415,260 කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

11. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ, හා බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

12. පුරප්පාඩු පිරවීම නොපිරවීම හෝ කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

13. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන භාෂා පාඨ අතර අනනුකූලතාවක් හෝ නොගැලපීමක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්ලිව්. කේ. දමිත් විජේරත්න,
අධ්‍යක්ෂ ජනරාල්.

2021 ජනවාරි මස 18 වැනි දින,
අංක 36, මලලසේකර මාවත, කොළඹ 07,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරුවලට නිලධාරීන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2020**

***Calling Applications for Recruitment of Officers to the Post of Assistant Director (Legal) of the Commission to Investigate Allegations of Bribery or Corruption - 2020***

01. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් :
උදා :- NIMAL A.B.C.D. :————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් : (ඉංග්‍රීසියෙන්) :————.

03. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

04. (i) ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් : (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :————.
(ii) රාජකාරි ලිපිනය : (රාජ්‍ය සේවයේ නියුක්ත නම්) :————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1

06. ජාතික හැඳුනුම්පත් අංකය :

07. ජනවර්ගය : (සිංහල -1, දෙමළ-2, ඉන්දියානු දෙමළ-3, මුස්ලිම්-4, වෙනත්-5)

08. උපන් දිනය :
වර්ෂය මාසය දිනය

2021.03.25 දිනට වයස :
අවු. මාස දින

09. දුරකථන අංකය : ජංගම
ස්ථාවර

10. අධ්‍යාපන සුදුසුකම් :

(උපාධියක් ඇත්නම්)
උපාධි පාඨමාලාව :————.
විශ්වවිද්‍යාලය :————.
උපාධිය පිළිබඳ විස්තර :————.

වෘත්තීය සුදුසුකම් :

2021.03.25 දිනට වෘත්තීය පළපුරුද්ද :
අවු. :————., මාස. :————., දින :————.

වෙනත් සුදුසුකම් :

1. .....................
2. .....................
3. .....................

11. රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ හෝ ධුරය හැරගිය අයකු ලෙස සළකනු ලැබූ කෙනෙක් ද ? :
ඔව්/ නැත :————.

12. කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ ද? :————.

පිළිතුර ඔව් නම් ඒ පිළිබඳ විස්තර :————.

13. ඔබ දැනට රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :————.

ආයතනය :————.
මුල් පත්වීමේ දිනය :————.
තනතුර :————.
වැටුප :————.

14. ඔබ ගැන තොරතුරු සැපයිය හැකි ඥාතීන් නොවන දෙදෙනකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න.

(i) ..................... (ii) .....................
..................... .....................
..................... .....................

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට හේතු වන බවත්, පත් කිරීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................... පදිංචි .......................... නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, 2021 ........ මස........ දින .................... දී ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
අත්සන.

නම හා පදවි නාමය :————.

නිල මුද්‍රාව :————.

දිනය :————.

***සටහන*** - දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි.

**අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම් :**

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*
මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................... මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ ස්ථිර/තාවකාලික තනතුරක් දරන බවත්, නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව හා අනෙකුත් අදාළ ලේඛන අනුව ඔහු/ඇය සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
දෙපාර්තමේන්තුව :————.

(අනවශ්‍ය වචන කපා හරින්න.)

02-305

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 නිලධර ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020 (2021)**

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරුවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 මැයි මස කොළඹදී පැවැත්වීමට නියමිත විවෘත තරග විභාගය සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ සුදුසුකම් සපුරාලන අපේක්ෂකයින්ට තනතුරු තුන සඳහාම ඉල්ලුම් කළහැක.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| වැඩහල සහකාර | 04 |
| වැඩහල ලිපිකරු | 02 |
| කාලගණක ලිපිකරු | 04 |

1. *වැටුප* :

 1.1. වැටුප් කේත අංකය : MN1-2016
 1.2 වැටුප් පරිමාණය : රු. 27,140- 10 x 300- 11x 350- 10 x 495- 10 x 660 -රු. 45,540

2. *බඳවා ගන්නා ශ්‍රේණිය* - III ශ්‍රේණිය

3. *අධ්‍යාපන සුදුසුකම්* :

 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම; සහ

 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව තව විෂයන් දෙකකට සම්මාන සාමාර්ථය සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම.

4. *වෘත්තීය සුදුසුකම්*.- පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා, මාස 03 කට නොඅඩු කාලසීමාවක පාඨමාලාවක් හදාරා තිබීම.

5. *කායික සුදුසුකම්* .- සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

6. වෙනත් සුදුසුකම් :

 i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
 ii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.
 iii.තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අතර අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

7. වයස :
 7.1 අවම සීමාව : අවු. 18 ට නොඅඩු
 7.2 උපරිම සීමාව : අවු. 30 නොවැඩි (ඒ අනුව 2003.03.19 දිනට හෝ ඊට පෙර හා 1991.03.19 දිනට හෝ පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

8. *බඳවා ගැනීමේ ක්‍රමය* .- ලිඛිත විභාගයේදී අයදුම්කරුවන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා අයදුම්කරුවන්ගේ මනාපය සැලකිල්ලට ගෙන උක්ත තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

9.
9.1 ලිඛිත විභාගය :

| | *විෂය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1 | භාෂා හැකියාව හා අවබෝධය | පැය 01 යි | 100 | 40 |
| 2 | අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 යි | 100 | 40 |

9.2 ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| භාෂා හැකියාව සහ අවබෝධය | අපේක්ෂකයින්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, සරල ව්‍යාකරණ භාවිතය හා සාරාංශ ගත කිරීම පිළිබඳ වූ ප්‍රශ්න පත්‍රවලින් යුක්තය |
| අභියෝග්‍යතා පරීක්ෂණය | අපේක්ෂකයින්ගේ සංඛ්‍යානමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය, තීරණ ගැනීමේ ශක්තියන් නිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රවලින් යුක්ත විය යුතුය. |

9.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

10. ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පතේ අංක 01

සිට 05 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවටද ඉතිරිය අනෙකුත් පිටුවලටද ඇතුළත් වන පරිදි සකස් කළ යුතු අතර විභාග යට පෙනී සිටීමට අපේක්ෂිත භාෂා මාධ්‍යයෙන් තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. එසේ සම්පූර්ණ කරන ලද අයදුම්පත් **(2021.03.19)** දින හෝ එදිනට පෙර ලැබෙන සේ ''විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින් අයදුම්පත, ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත්, විභාග ගාස්තුව ගෙවීමට අදාළ ලදුපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා ඇත්ද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතුය. අයදුම්පතෙහි හා විභාග ගාස්තුවට අදාළ මුදල් ලදුපතේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

11. විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු ඇතුළත් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද විභාග ගාස්තුව ගෙවීමට අදාළ ලදුපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා ඇත්ද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතු අතර මුදල් ලදු පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. නිසියාකාරව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

12. 1 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* : ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

13. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂයකු වේනම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවරුදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායීවනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **''රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 නිලධර ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020-(2021)''** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

13.1 විභාග ගාස්තුව රු. 750.00 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක්/දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරු නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුවලට අතරව කිසිදු අය කිරීමක් සිදු නොකරනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාග සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.

13.2 අපේක්ෂකයෙකු විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

14. අයදුම්පතේ සහ විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන

ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු/විශ්‍රාම නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු ලවා සහතික කර ගත යුතුය. දැනටමත් රාජ්‍ය ආයතනයක සේවය කරන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.

15. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගතහැකි වන පරිදි මුහුණ හා දෙකන් අවාරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් අවාරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

16. *විභාග ප්‍රතිඵල* :- මෙම නිවේදනයේ 9.1 ඡේදයට අනුව එක් එක් විෂයට ලකුණු 40% කට නොඅඩුව ලබා ගන්නා අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙළට සකස් කළ ප්‍රතිඵල ලේඛනය ''**අධ්‍යක්ෂ ජනරාල්, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, කොලොන්නාව**'' වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත, ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.result.exam.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

17. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ කර්මාන්තශාලා
දෙපාර්තමේන්තුව.

2021 පෙබරවාරි මස 09 වැනි දින,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොලොන්නාව පාර,
කොලොන්නාව.

ආදර්ශ අයදුම්පත්‍ර

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන -ඛණ්ඩ 2 නිලධර ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020(2021)**

Open Competitive examination for the recruitment to the posts of Management Assistant Non Technical - Segment 2 Officer Category of the Department of Government Factory 2020 (2021)

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2, දෙමළ -3, ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අයදුම්කරන තනතුර - (අයදුම්කරුගේ කැමැත්ත අනුපිළිවෙලට තනතුරු අංකය සටහන් කරන්න)

| තනතුරු අංකය | තනතුර |
|---|---|
| 01 | වැඩහල සහකාර |
| 02 | වැඩහල ලිපිකරු |
| 03 | කාලගණක ලිපිකරු |

| කැමැත්ත | තනතුර අංකය |
|---|---|
| පළමු | |
| දෙවන | |
| තෙවන | |

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

2. විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :

 (i) ඉංග්‍රීසි කැපිටල් අකුරින් (In Block Letters) :————.

 (ii) සිංහලෙන්/දෙමළෙන් :————.

3. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ -0 ස්ත්‍රී -1 | | (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

5. ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

6. ලිපිනය :

 (i) පෞද්ගලික ලිපිනය : ......................................................

 (ii) දිස්ත්‍රික්කය : ......................................................

7. උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

8. විවාහක/අවිවාහක බව :————.

9. පුරවැසිභාවය : පරම්පරාවෙන්/ලියාපදිංචියෙන්

10. අධ්‍යාපන සුදුසුකම්

 I. අ.පො.ස. (සා. පෙළ) විභාගය :

 විභාග අංකය :————. වර්ෂය :————. මාධ්‍යය :————.

| | සමත් වූ විෂයන් | ශ්‍රේණිය | | සමත් වූ විෂයන් | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| (1) | ..................... | ...... | (6) | ..................... | ...... |
| (2) | ..................... | ...... | (7) | ..................... | ...... |
| (3) | ..................... | ...... | (8) | ..................... | ...... |
| (4) | ..................... | ...... | (9) | ..................... | ...... |
| (5) | ..................... | ...... | (10) | ..................... | ...... |

 II. අ.පො.ස. (උ/පෙළ) විභාගය :

 විභාග අංකය :————. වර්ෂය :————. මාධ්‍යය :————.

| | සමත් වූ විෂයන් | ශ්‍රේණිය |
|---|---|---|
| (1) | ..................... | ...... |
| (2) | ..................... | ...... |

(3) ..................... ......
(4) ..................... ......

11. *වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :*

| අනු. අංකය | පාඨමාලාවේ නම | ආයතනය | කාලසීමාව | ප්‍රතිඵල |
|---|---|---|---|---|
| 01. | | | | |
| 02 | | | | |
| 03. | | | | |

12. දැනට කිසියම් තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :

(i) තනතුර හා ශ්‍රේණිය : ....................................................
(ii) පත් වූ දිනය : ....................................................
(iii) ආයතනය : ....................................................
(iv) විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ද යන වග : ....................................................

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගැනීමට ලැබුණහොත් මා නුසුදුස්සකු වන බවත්, පත් කිරීමෙන් පසු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මා දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. *විභාග ගාස්තුව ගෙවීම පිළිබඳ විස්තර :*

13.1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් (අකුරින්) :————.
13.2 කුවිතාන්සි අංකය :————.
13.3 නිකුත් කළ කාර්යාලය :————.
13.4 දිනය :————.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයක් මෙහි අලවන්න.<br><br>(ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න.) |

14. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*
මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ........................ නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, නියමිත

විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ............ දින ඔහු/ඇය මා ඉදිරිපිට අත්සන් තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන

දිනය :————.

සහතික කරන්නාගේ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

නිල මුද්‍රාව :————.

15. *රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

........................මහතා/මහත්මිය/මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව.

දිනය :————.

02-585/2

---

**ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන -ඛණ්ඩ 2 නිලධර ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2020 (2021)

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරුවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 මැයි මස කොළඹ දී පැවැත්වීමට නියමිත සීමිත තරඟ විභාගය සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ සුදුසුකම් සපුරාලන අපේක්ෂකයින්ට තනතුරු තුන සඳහාම ඉල්ලුම් කළහැක.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| වැඩහල සහකාර | 04 |
| වැඩහල ලිපිකරු | 02 |
| කාලගණක ලිපිකරු | 04 |

1. *වැටුප* :

1.1. වැටුප් කේත අංකය : MN1-2016

1.2 *වැටුප් පරිමාණය* :- රු. 27,140- 10 x 300- 11 x 350- 10 x 495- 10 x 660 -රු. 45,540

2. බඳවා ගන්නා ශ්‍රේණිය - III ශ්‍රේණිය

3. *අධ්‍යාපන සුදුසුකම්* :

ප්‍රාථමික ශ්‍රේණියේ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය ශ්‍රේණීන්හි සේවයේ නියුතු විය යුතුය.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යේ දී එක් වරකදී භාෂාව, ගණිතය යන විෂයයන් දෙකට (02) සම්මාන සාමර්ථ්‍යයන් සහිතව විෂයයන් (06) හයකට නොඅඩුව සමත්ව තිබීම.

4. *වෘත්තීය සුදුසුකම්* : පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා, මාස 03 කට නොඅඩු කාලසීමාවක පාඨමාලාවක් හදාරා තිබීම.

5. *කායික සුදුසුකම්* : අදාළ නොවේ.

6. *වෙනත් සුදුසුකම්* :

i. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

ii. අයදුම්කරුවන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

iii. නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර, ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය.

7. *බඳවා ගැනීමේ ක්‍රමය* : ලිඛිත විභාගයේ දී අයදුම්කරුවන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා අයදුම්කරුවන්ගේ මනාපය සැලකිල්ලට ගෙන උක්ත තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

8.

8.1 *ලිඛිත විභාගය* :

| | විෂයය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | භාෂා හැකියාව හා අවබෝධය | පැය 01 යි | 100 | 40 |
| 2 | එකතු කිරීම ඇතුළු ගණිතය හා බුද්ධි පරීක්ෂණය | පැය 01 යි | 100 | 40 |

8.2 ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| භාෂා හැකියාව සහ අවබෝධය | අපේක්ෂකයින්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, සරල ව්‍යාකරණ භාවිතය හා සාරාංශගත කිරීම පිළිබඳ වූ ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| එකතු කිරීම ඇතුළු ගණිතය හා බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයින්ගේ සංඛ්‍යානමය හැකියාවන්, (එකතු කිරීම, අඩු කිරීම හා බෙදීම) තර්කන ශක්තිය, නිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

8.3. වයස : අදාළ නොවේ.

8.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය
ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

09. ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පතේ අංක 01 සිට 08 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවට ද, අංක 09 සිට 12 දක්වා ශීර්ෂ දෙවන පිටුවට ද ඉතිරිය 03 පිටුවටද ඇතුළත් වන පරිදි අයදුම්පත සකස් කළ යුතු අතර විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත භාෂා මාධ්‍යයෙන් තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත් වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. එසේ සම්පූර්ණ කරන ලද අයදුම්පත් (2021.03.19) දින හෝ එදිනට පෙර ලැබෙන සේ ''**විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ**'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින් අයදුම්පත, ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත්, විභාග ගාස්තුව ගෙවීමට අදාළ ලදුපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා

ඇත් ද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතුය. අයදුම්පතෙහි හා විභාග ගාස්තුවට අදාළ මුදල් ලදුපතේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

10. විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. විභාග ගාස්තුව රු. 750.00 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක්/දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරු නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාග සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලබන අතර ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

12.

12.1 ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු ඇතුළත් කර ඇති අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය, නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදළ නම් ඊට අදළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදනමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

12.2 අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

13.

13.1 අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 නිලධර සඳහා සීමිත තරග විභාගය - 2020(2021)**" යනුවෙන් තමා අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

13.2 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

14. *අත්සන සහතික කරවා ගැනීම* :

- දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතු අතර නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත නිසි පරිදි අයදුම්පතෙහි අලවා තිබිය යුතුය.

- විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

  i. ජාතික හැඳුනුම්පත;
  ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
  iii. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුලු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

14.1 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින්

යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවරනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

14.2 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :- ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාග නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

14.3 විභාග ප්‍රතිඵල :- එක් එක් විෂයයට ලකුණු 40% කට නොඅඩුව ලබා ගන්නා අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙළට සකස් කළ ප්‍රතිඵල ලේඛනය ''අධ්‍යක්ෂ ජනරාල්, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, කොලොන්නාව'' වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත, ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results exam.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

14.4. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ කර්මාන්තශාලා
දෙපාර්තමේන්තුව.

2021 පෙබරවාරි 09 වැනි දින,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොලොන්නාව පාර,
කොලොන්නාව.

ආදර්ශ අයදුම්පත්‍රය

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන -ඛණ්ඩ 2 නිලධර ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2020(2021)**

**Limited Competitive examination for the rccruitment to the posts of Management Assistant Non Technical - Segment 2 Officer Category of the Department of Government Factory 2020(2021)**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2 දෙමළ -3 ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අයදුම්කරන තනතුර - (අයදුම්කරුගේ කැමැත්ත අනුපිළිවෙලට තනතුරු අංකය සටහන් කරන්න)

| තනතුරු අංකය | තනතුර |
|---|---|
| 01 | වැඩහල සහකාර |
| 02 | වැඩහල ලිපිකරු |
| 03 | කාලගණක ලිපිකරු |

| කැමැත්ත | තනතුර අංකය |
|---|---|
| පළමු | |
| දෙවන | |
| තෙවන | |

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

2. විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

3. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ -0 ස්ත්‍රී -1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

5. ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

6. ලිපිනය :

(i) පෞද්ගලික ලිපිනය : ......................................................

......................................................

(ii) දිස්ත්‍රික්කය : ......................................................

7. උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

8. විවාහක/අවිවාහක බව :————.

9. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගය :

විභාග අංකය :————. වර්ෂය :————. මාධ්‍යය :————.

| | සමත් වූ විෂයන් | ශ්‍රේණිය | | සමත් වූ විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| (1) | ..................... | ...... | (6) | ..................... | ...... |
| (2) | ..................... | ...... | (7) | ..................... | ...... |
| (3) | ..................... | ...... | (8) | ..................... | ...... |
| (4) | ..................... | ...... | (9) | ..................... | ...... |
| (5) | ..................... | ...... | (10) | ..................... | ...... |

(ii) අ.පො.ස. (උ/පෙළ) විභාගය :

විභාග අංකය :————. වර්ෂය :————. මාධ්‍යය :————.

| | සමත් වූ විෂයන් | ශ්‍රේණිය |
|---|---|---|
| (1) | ..................... | ...... |
| (2) | ..................... | ...... |
| (3) | ..................... | ...... |
| (4) | ..................... | ...... |

10. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

| අනු අංකය | පාඨමාලාවේ නම | ආයතනය | කාලසීමාව | ප්‍රතිඵල |
|---|---|---|---|---|
| 01. | | | | |
| 02 | | | | |
| 03. | | | | |

11. වෙනත් සුදුසුකම් :............................................................................................................
.....................................................................................................................................
.....................................................................................................................................

12. දැනට කිසියම් තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :

(i) තනතුර හා ශ්‍රේණිය : ..................................................
(ii) පත් වූ දිනය : ..................................................
(iii) ආයතනය : ..................................................
(iv) විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ද යන වග : ..................................................

අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවරැදි බව සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වරැදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගැනීමට ලැබුණහොත් මා නුසුදුස්සකු වන බවත්, පත් කිරීමෙන් පසු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මා දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. විභාග ගාස්තුව ගෙවීම පිළිබඳ විස්තර :

13.1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් (අකුරින්) :————.
13.2 කුවිතාන්සි අංකය :————.
13.3 නිකුත් කළ කාර්යාලය :————.
13.4 දිනය :————.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයක් මෙහි අලවන්න.<br><br>මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න. |

14. ආයතන ප්‍රධානියාගේ සහතිකය :
14.1 මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................... මයා/මිය/මෙනවිය ............... දින සිට මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත් ............ දිනට පූර්වයෙන් වූ සතුටුදයක පස් අවුරුදු සේවා කාලය සම්පූර්ණ කර ඇති බවත් ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු මෙම දෙපාර්තමේන්තුවේ ඇති වාර්තා ආශ්‍රයෙන් ඒවා නිවැරදි බවත් අදාළ දැන්වීම් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති/නැති බවත් නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

02-585/1

**අධිකරණ අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම (විවෘත පදනම මත) - 2021**

අධිකරණ අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) III ශ්‍රේණියේ තනතුරු 07ක් සඳහා සුදුස්සන් තෝරාගැනීම සඳහා විවෘත පදනම මත අයදුම්පත් කැඳවන අතර මෙහි දී සිවිල් ක්ෂේත්‍රයේ සහතිකපත්ලාභීන්ගේ අයදුම්පත් පමණක් සළකා බලනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර **ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ'' **අධිකරණ අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) III ශ්‍රේණියේ තනතුර** සඳහා බඳවා ගැනීම (විවෘත)'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය **2021.03.12** වේ.

**සටහන.**-ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

විභාග කොමසාරිස් ජනරාල් හෝ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින් සිදු කරනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර තෝරාගනු ලබයි.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය.

**සටහන** - තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් වේ.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරියකු වසර 03ක පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර 03 ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළ දී ලබා ගත යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් වසර 03ක් තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය වසර 05ක් ඇතුළත ලබාගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව MN-3-2016, රු. 31,040-10x 445-11x660-10x730-10x750- රු. 57,550ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවනු ලැබේ.)

04. *සුදුසුකම් :*

(i) *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයයන් 06කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම;

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්ට අදළව සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

(ii) *වෘත්තීය සුදුසුකම් :*

(අ) මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතන විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (සිවිල්);

හෝ

(ආ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්);

හෝ

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්);

හෝ

(ඈ) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්);

හෝ

(ඉ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම (සිවිල්);

හෝ

(ඊ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම;

හෝ

(උ) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 වන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

05. *පළපුරුද්ද* :
අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති සේවා පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැළකේ.

06. *කායික සුදුසුකම්* :
සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

07. *වෙනත් සුදුසුකම්* :

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

08. *වයස් සීමාව* :
අයදුම් පත් භාර ගන්නා දිනට වයස අවු. 18ට නොඅඩු. උපරිම අවු. 30ට නොවැඩි විය යුතුය.

09. *බඳවා ගැනීමේ ක්‍රමය* :
ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

10. *ලිඛිත පරීක්ෂණය* :

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. පොදු පරීක්ෂණය | 100% | 40% |
| 2. සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය | 100% | 40% |

11. *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* :

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

12. (i) ඉල්ලුම් පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, 1-12 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 13 සිට අවසන් වන තෙක් ශීර්ෂ දෙවන හා තුන්වන පිටුවලට වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදළ තොරතුරු තම අත්අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුණහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම් පත මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම් පතට අනුව සැකසිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

**සැලකිය යුතුය.-** (අ.) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපත් නොඇමිණිය යුතුය.

(ආ.) ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(ii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත්‍ර එවිය යුතුය.

13. *විභාග ගාස්තු :*
සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තු ලෙස රු. 500 මුදලක් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ නමට වන සේ ගිණුම් අංක 176 1001 99025184 ගිණුමට බැර කළ යුතු වේ. අදළ කුවිතාන්සියේ මුල් පිටපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ අමුණා එවිය යුතුය.

14. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා අධිකරණ අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදළ වේ.

15. මෙම පුරප්පාඩු සම්පූර්ණයෙන් හෝ එයින් කොටසක් පිරවීම අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අභිමතය පරිදි වේ.

එම්. එම්. පී. කේ. මායාදුන්නෙ,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 12 වැනි දින.

| |
|---|
| අංකය............................<br>(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා) |

ආදර්ශ අයදුම්පත්‍රය

**අධිකරණ අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය 2021 (විවෘත පදනම මත)**

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04. දුරකතන අංකය :————.

05. විද්‍යුත් ලිපිනය :————.

06. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

07. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

08. උපන් දිනය :————. වර්ෂය :————. මාසය :————. දිනය :————.

09. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : වර්ෂ :————. මාස :————. දින :————.

10. ජාතිය :————.

11. විවාහක/අවිවාහක බව :————.

12. *අ.පො.ස (සා.පෙළ) විභාග ප්‍රතිඵල :*

විභාග අංකය :————.  විභාගයට පෙනී සිටි වර්ෂය :————.

විෂයය :-............සාමාර්ථය :-............ විෂයය :-............සාමාර්ථය :-............
විෂයය :-............සාමාර්ථය :-............ විෂයය :-............සාමාර්ථය :-............
විෂයය :-............සාමාර්ථය :-............ විෂයය :-............සාමාර්ථය :-............
විෂයය :-............සාමාර්ථය :-............ විෂයය :-............සාමාර්ථය :-............
විෂයය :-............සාමාර්ථය :-............ විෂයය :-............සාමාර්ථය :-............

13. *අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල :*

විභාග අංකය :————.  විභාගයට පෙනී සිටි වර්ෂය :————.

විෂයය :-..................... සාමාර්ථය :-.....................
විෂයය :-..................... සාමාර්ථය :-.....................
විෂයය :-..................... සාමාර්ථය :-.....................

14. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 04 ඡේදයේ (II) වගන්තිය අනුව සුදුසුකම් :

(i) ........................................................................................................
(ii)........................................................................................................
(iii)........................................................................................................
(iv)........................................................................................................
(v)........................................................................................................
(vi)........................................................................................................

15. *භාෂා ප්‍රවීණතාව* :- (අදාළ තීරුවේ ✓ ලකුණ යොදන්න)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

16. *විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සිය :*

| අදළ කුවිතාන්සියේ මුල් පිටපත නොගැළවෙන සේ මෙහි අලවන්න. |
|---|

***අයදුම්කරුගේ සහතිකය***

.............................. වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයෙකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරාගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුසු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා පමණක් අදාළ වේ.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ....................................... මයා/මිය/මෙනවිය ........./........./... දින සිට .................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ................ වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් නිලධාරියකු/නිලධාරිනියක වශයෙන් සේවය කරන බවත්, ඔහු/ඇය විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අදාළ පුවත්පත් නිවේදනය ප්‍රකාරව ඔහු/ඇය මේ සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, එම නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළහැකි/නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

02-708

---

**තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂවරුන් (දෙපාර්තමේන්තුගත) සඳහා වන**
**පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020**

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ පවත්නා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂවරුන්ගේ (දෙපාර්තමේන්තුගත) පළමු කාර්යක්ෂමතා කඩඉම සඳහා වන විභාගය මෙම අමාත්‍යාංශය වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 මැයි මස කොළඹ දී පවත්වනු ලැබේ.

02. *විභාග පටිපාටිය* :

(අ) මෙම විභාගය එක් ප්‍රශ්න පත්‍රයකින් යුක්තවන අතර එම ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශය පහත සඳහන් වේ. (අංක 03)

(ආ) විෂයය සඳහා මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 100ක් වන අතර, සමත්වීමේ අවම ලකුණු ප්‍රමාණය 40කි.

(ඇ) මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ඈ) *විභාග ගාස්තු* :
පළමුවන වතාවට විභාගයට ඉදිරිපත් වීමේදී විභාග ගාස්තුවෙන් නිදහස් වේ. පළමුවන වතාව නොවන විට විභාගය සඳහා රු.500/- ක ගාස්තුවක් අය කෙරේ.

එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් හෝ දිස්ත්‍රික් /ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරු නමින් ලබාගන්නා ලදුපත එහි එක් දාරයකින් අයදුම්පතේ නියමිත ස්ථානයේ අලවා එවිය යුතුය.

03. *ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශය* :

කාලය පැය 03

1. ව්‍යාපාර කළමනාකරණය හා සංවර්ධනය (විෂය අංකය - 01)
   - ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය
   - ව්‍යාපාර කළමනාකරණය හා සම්බන්ධවන අලෙවි, මානව, මූල්‍ය හා මෙහෙයුම් යන කළමනාකරණ ක්ෂේත්‍රයන්
   - ව්‍යාපාර ආචාර ධර්ම හා සමාජ වගකීම
   - ශක්‍යතා අධ්‍යයන හා ව්‍යාපෘති වාර්තා සකස් කිරීම.

04. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(අ) මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව ඉල්ලුම් පත්‍රය ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ පිළියෙල කර ගත යුතුය. ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක (1) සිට (2) තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද ඇතුළත් විය යුතුය. ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල විය යුතු වන අතර, එසේ නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය. (සම්පූර්ණ කරන ලද ඉල්ලුම්

පත්‍රයේ සහ මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

(ආ) නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් 2021.03.19 දිනට පෙර ලැබෙන ලෙස පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. :-

විභාග කොමසාරිස් ජනරාල්
ආයතනික විභාග සංවිධාන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ.පෙ. 1503
කොළඹ

(ඇ) ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයේ ඉහළ වමත් පස "තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂවරුන් (දෙපාර්තමේන්තුගත) සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2020 " යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් භාර ගනු නොලැබේ.

(ඈ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

05. *විභාගයට පෙනී සිටීම* :

(අ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විභාග ශාලාධිපතිට, අත්සන සහතික කරවාගත් තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයන්ට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

**සටහන.-** අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර තිබීම විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

(ආ) විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

අනුරාධ විජේකෝන්,
ලේකම්,
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 11 වැනි දින,
කොළඹ 07, පිලිප් ගුණවර්ධන මාවතේ
අංක 09
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ දී.

ආදර්ශ අයදුම්පත

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂවරුන් (දෙපාර්තමේන්තුගත) සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020**

First Efficiency Bar Examination for Assistant Directors (Departmental) of the Small Enterprises Development Division under the Ministry of Youth & Sports - 2020

විභාගයට පෙනී සිටින මාධ්‍යය : ☐

සිංහල - 2 / දෙමළ - 3 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. නම :
   1.1 සම්පූර්ණ නම :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

   1.2 සම්පූර්ණ නම :————.
   (සිංහලෙන් /දෙමළෙන්)

   1.3 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   උදාහරණය : GUNAWARDANA, M.G.B.S.K :————.

   1.4 ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

02. 2.1. රාජකාරි ලිපිනය :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   (මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

   2.2 ස්ථිර ලිපිනය :————.
   (සිංහලෙන්/දෙමළෙන්)

   2.3 ස්ත්‍රී / පුරුෂ භාවය : ☐
   (ස්ත්‍රී - 1 පුරුෂ - 0) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

03. විභාගයට පෙනී සිටින්නේ කී වෙනි වතාවට ද යන වග : .......................................

04. විභාග ගාස්තු :
   (i) ගෙවන ලද ගාස්තුව : රු. .................. (ii) ගෙවූ කාර්යාලය : ...............................
   (iii) ගෙවූ දිනය : ................................. (iv) ලදුපත් අංකය : .................................

*ගැසට්* නිවේදනයේ අංක 02(ඇ) ඡේදය අනුව, විභාග ගාස්තු ගෙවූයේ නම් එම ලදුපත මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අත්‍යවශ්‍ය වනු ඇත.

05. අයදුම්කරුගේ ප්‍රකාශය :

ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

06. ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ............................................... මයා/මිය/මෙනෙවිය, මා ඉදිරියේ දී අත්සන් තැබූ බව ද ඔහු/ ඇය විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව ද අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බව ද සහතික කරමි. තව ද, ඔහු/ඇය පළමු වතාවට මෙම විභාගය සඳහා ඉදිරිපත්වන බව ද / විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන

දිනය :————.
නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

02-707

---

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර යාන්ත්‍රික සහ දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර විදුලි තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

**Open Competitive Examination for Recruitment to Grade III of Railway Technological Management Assistant (Mechanical) and Railway Technological Management Assistant (Electrical) in Management Assistant Technological Service Category Segment - 2-2021**

සංශෝධන 01

ඉහත තනතුරුවලට බඳවා ගැනීම සඳහා පළ කරන ලද 2021.02.05 දිනැති *ගැසට් නිවේදනයේ* 04 හි සඳහන් පහත කොන්දේසිය සංශෝධනය කිරීම.

04. බඳවා ගැනීමේ කොන්දේසි :

2017.06.15 දින වන විට ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයේ පුහුණු පාඨමාලා සඳහා ඇතුලත් කරගෙන ඇති පුහුණුලාභීන් සඳහා පමණක් අදාළ පාඨමාලා සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ලබා දෙනු ලබන පුහුණු සහතිකය ලබා ඇත්නම් ඉහත අධ්‍යාපන සුදුසුකම් නොසලකා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

යන්න පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අමප/17/2882/709/102-1 හා 2017.12.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා නව වැටුප් ව්‍යුහයක් සකස් කරන තෙක් ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයේ පුහුණු පාඨමාලා සඳහා ඇතුලත් කර ගනු ලබන පුහුණුලාභීන් සඳහා පමණක් අදාළ පාඨමාලා සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ලබා දෙනු ලබන පුහුණු සහතිකය ලබා ඇත්නම් 2021.02.05 දිනැති *ගැසට් නිවේදනයේ* සඳහන් අධ්‍යාපන සුදුසුකම් නොසලකා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

*ගැසට් නිවේදනයේ* සඳහන් අනිකුත් කරුණු නොවෙනස්ව එලෙසම ක්‍රියාත්මක වේ.

එච්. එම්. නන්දසේන,
අතිරේක සාමාන්‍යාධිකාරී (පරිපාලන),
දුම්රිය සාමාන්‍යාධිකාරී *වෙනුවට*.

2021 පෙබරවාරි මස 09 වැනි දින,

02-719

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.